කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

**ජනමාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව - 2017**

**DJ 03 – මාධ්‍ය විෂයක නිර්මාණාත්මක ලේඛන කලාව**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය තුනයි.

---

01. 'නිර්මාණශීලී ලේඛනය මුද්‍රිත මාධ්‍ය පාඨකයාට ආධ්‍යාත්මික ආස්වාදය හා බුද්ධි වර්ධනය සම්පාදනය කරයි.' විමසන්න.

02. විශේෂිත පුද්ගලයකු සමග සම්මුඛ සාකච්ඡාවක් මෙහෙයවීමේදී පූර්ව පසුබිම් අධ්‍යයනය හා පර්යේෂණ වැදගත් වන ආකාරය විස්තර කරන්න.

03. 'කර්තෘ වාක්‍ය රචනය සඳහා සමකාලීන ගැටලු හා පාඨක අවශ්‍යතා පිළිබඳ සප්‍රමාණ අවබෝධයක් තිබිය යුතුය.' සාකච්ඡා කරන්න.

හෝ

පුවත්පත් ලේඛනයක පාරිශුද්ධත්වය, ගෞරවය හා විශ්වසනීයත්වය නිර්නාමික ව ආරක්ෂා කරන්නේ උපකර්තෘවරයා ය. උපකර්තෘවරයාගේ කාර්යභාරය ඇසුරින් විමසන්න.

04. පාඨක අවධානය ගිලිහී යා නොදී ස්වකීය ලේඛනය කෙරෙහි පාඨකයා රඳවා තබාගත හැක්කේ කෙසේදැයි විස්තර කරන්න.

05. නිර්මාණශීලී ලේඛනයේ ස්වලක්ෂණ හඳුන්වා දී නිර්මාණශීලී ලේඛනය ශාස්ත්‍රීය හා විඥාපනාත්මක ලේඛනයෙන් වෙනස් වන ආකාරය විග්‍රහ කරන්න.

*(අනෙක් පිටුවට)*

06. පහත සඳහන් මාතෘකා අතරින් <u>එකක්</u> තෝරාගෙන විශේෂාංග රචනයක් ලියන්න.

(i) ශ්‍රී ලාංකේය දේශපාලනයෙහි කාන්තා සහභාගිත්වය
(ii) ජාතික සංවර්ධනය සඳහා සන්නිවේදනය
(iii) ඔබ කැමති ප්‍රබුද්ධ සාහිත්‍යවේදියා

07. වර්තමාන පුවත්පත් කලාව තුළ දක්නට ලැබෙන තීරු ලිපි ප්‍රභේද හඳුන්වා දී ඔබට අභිමත ප්‍රභේදයක් අලළා නිදර්ශනාත්මක විග්‍රහයක් සපයන්න.

08. 'වඩාත් ප්‍රතිඵලාභිමුඛ සන්නිවේදන ප්‍රකාරය වන්නේ වෙළඳ දැන්වීම්කරණයයි.' ශ්‍රී ලාංකේය වෙළඳ දැන්වීම්කරණ ක්ෂේත්‍රයට විශේෂිත ව සාකච්ඡා කරන්න.

09. පහත සඳහන් මාතෘකා අතරින් <u>හතරක්</u> තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) කර්තෘට ලියුම්
(ii) සිනමා විචාරය
(iii) මාධ්‍ය මූලික පරිවර්තනය
(iv) ඡායාරූප පුවත්පත් කලාව
(v) සිරි ගුනසිංහ
(vi) ජනප්‍රිය ටෙලිනාට්‍ය කලාව
(vii) කාටූනයක එලදායිතාව
(viii) පුවත්පත් අතිරේක